www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඇමරිකානු ජනාධිපතිවරනයේ සමාජවාදී අපේක්ෂක බිල් වැන් ශ්‍රී ලංකාවේදී ඔබ අමතයි

**Socialist Equality Party presidential candidate to speak in Sri Lanka**

ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය (සසප) සහ *ලෝක සමාජවාදී වෙබ් අඩවිය*, එක්සත් ජනපදයේ තම සහෝදර පක්ෂයෙන් ජනාධිපතිවරනයට ඉදිරිපත් වී සිටින බිල් වැන් ඕකන් ඔක්තෝබර් 23, 25 යන දිනයන්හි දී පිලිවෙලින් කොලඹ සහ මහනුවර රැස්වීම් දෙකක් අමතන බැව් නිවේදනය කරනුයේ මහත් සතුටිනි.

ශ්‍රී ලාංකික, සමස්ත ඉන්දියානු උප මහාද්වීපික සහ ජාත්‍යන්තර කම්කරුවන්ට, තරුන ජනතාවට සහ බුද්ධිමතුන්ට එක්සත් ජනපද සසප ජනාධිපතිවරන උද්ඝෝෂනයේ දැවැන්ත දේශපාලන අර්ථභාරයක් ඇත. ඉරාකය යටත් කර ගැනීම සම්බන්ධයෙන් එක්සත් ජනපදය තුල ඉතා පැහැදිලිව විරුද්ධ වන සහ එක්සත් ජනපද මිලිටරිවාදයේ පුපුරා යාමට එරෙහිව ලොව පුරා කම්කරුවන් එකමුතු කිරීම සඳහා සමාජවාදී ඉදිරි දර්ශනයක් ඉදිරිපත් කරන එකම පක්ෂය සසප යි. ලන්ඩනය තුල පූර්වයෙන් පැවැත්වෙන රැස්වීම සහ ශ්‍රී ලංකාවේ පැවැත්වෙන රැස්වීම් මෙම ජාත්‍යන්තරවාදී උද්ඝෝෂනයේ අත්‍යන්ත කොටසකි.

එක්සත් ජනපදයේ නායකත්වයෙන් සිදු කරන ලද ඉරාක ආක්‍රමනය ලෝක ඉතිහාසයේ නව කාල පරිච්ඡේදයක් සටහන් කරයි. ඉරාකය ආක්‍රමනය කිරීම සඳහා බුෂ් පරිපාලනය විසින් යොදා ගනු ලැබූ සියලු කඩතුරාවන් - ඉරාකය සතු ජන සංහාරක අවි, අල් කයිඩා ව්‍යාපාරය සමග සදාම් හුසේන් ගේ සබඳතා සහ ඉරාකය ප්‍රජාතන්ත්‍රීයකරනය - සියල්ලම පරිපූර්න වසයෙන්ම මුසාවාද බැව් අනාවරනය වී ඇත. මෙම නීති විරෝධී යුද්ධයේ අරමුන වූයේ සමස්ත මැද පෙරදිග හා ජාත්‍යන්තරව තම ආධිපත්‍යය තහවුරු කර ගැනීමේ එක්සත් ජනපද අභිලාෂයේ කොටසක් ලෙස ඉරාකය මත සහ එය සතු දැවැන්ත තෙල් සම්පත් මත පාලනය සුරක්ෂිත කර ගැනීමයි. ඉරාක මහ ජනතාවගේ ප්‍රතිරෝධී අරගල මැඩීම එල්ල කර ගත් වොෂින්ටනයේ ලේ වැකි මිලිටරි මර්දන සමග ඇමරිකාව තුලමත් ජීවත් වන කම්කරු ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් හා සමාජ කොන්දේසිවලට එල්ල කෙරෙන රුදුරු ප්‍රහාර ඒකාබද්ධ වේ.

එක්සත් ජනපදයේ සමස්ත දේශපාලන සංස්ථාපිතයම, ඉරාකය තුල දිගටම තම හමුදා රඳවා තැබීම කෙරෙහි සිය සහයෝගය දක්වන අතර දස ලක්ෂ සංඛ්‍යාත ඇමරිකානුවන්ගේ බලගතු යුද විරෝධී හැඟීම්වලට මැතිවරනය තුල ප්‍රකාශනයක් අත් කර ගත හැකි කවර හෝ මාර්ගයක් වලකාලීම සඳහා වියරු සහගතව ක්‍රියා කරයි. ජනාධිපති බුෂ් සහ ඩිමොක්‍රැටික් පක්ෂ අපේක්ෂක ජෝන් කෙරී අතර පවත්නා වෙනස්කම් ඉතා පැහැදිලිව ම උපායික ඒවා ය. ඉරාකයෙන් හමුදා සේනාංකයන් ඉවත් කරනවා වෙනුවට කෙරී අවධාරනය කරනු ලබන්නේ යුද්ධය වඩාත් ඵලදායී ආකාරයෙන් ගෙන යාමට තමාට හැකි බවයි. බුෂ් සමග පැවැත්වූ මෑත විවාදයේදී, “මම ජයග්‍රහනය සඳහා හමුදාවන්ට නායකත්වය දීමට යන්නෙමි” යි කෙරී පුරසාරම් දෙඩී ය.

මැද පෙරදිග දී මෙන්ම, ඉන්දියානු උපමහාද්වීපයේ දී ද, ඊනියා තුන්වැනි ලෝකයේ දේශපාලන නායකයින් ඉතා පැහැදිලිව පෙන්නුම් කර ඇත්තේ තමුන් බුෂ් පරිපාලනයේ නිවට නියාලු අතවැසියන් බව සහ ඉරාක මහජනතාවගේ මූලික අයිතීන් ආරක්ෂා කිරීමට තමාගේ ඇති අසමර්ථභාවය යි. කූට “ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ” නාමයෙන් ඉන්දියානු සහ බංග්ලාදේශ ආන්ඩු පකිස්තානයේ මිලිටරි තන්ත්‍රය සමග එක්ව වොෂින්ටනයේ සොච්චම් ද්‍රව්‍යමය සහ දේශපාලනික ත්‍යාගයන් බලාපොරොත්තුවෙන් ඉරාක ආක්‍රමනයට පිටු බලය ලබා දුන්හ.

ශ්‍රී ලංකාවේ එක්සත් ජනතා නිදහස් සන්ධාන ආන්ඩුව මෙයට වෙනස් නො වේ. වරෙක “මාක්ස්වාදී” හා “සමාජවාදී” ලෙස ව්‍යාජව තමා හඳුන්වා ගත් ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) භූමිකාව විශේෂයෙන්ම අනාවරනය වෙමින් පවතී. දැන් ධනේශ්වර පාලක සභාගයේ කොටසක්ව සිටින ජවිපෙ පූච්චානමුන් ඔවුනගේ අධිරාජ්‍ය විරෝධී පූච්චානම් පැරැනි සුන්බුන් අතරට එකතු කොට ඇති අතර ඉරාකය තුල එක්සත් ජනපදය විසින් දිනපතා ගෙන යන රුදුරු සංහාරයට එරෙහිව එක වචනයක් හෝ කතා නොකරයි. වොෂින්ටනයට මෙසේ අනුගත වීම ඔවුනගේ ජාතිකවාදී සහ වාර්ගික ක්‍රියා මාර්ගයේ තර්කානුකූල ප්‍රතිඵලය යි.

අත්‍යවශ්‍ය පාඩම් උකහා ගත යුතු වේ. එක්සත් ජනපදය තුල හා ජාත්‍යන්තර ව මෙන්ම ශ්‍රී ලංකාව තුලද අවශ්‍ය කෙරී ඇත්තේ සමස්ත දේශපාලන සංස්ථාපිතයෙන්ම බිඳී වෙන්වීම සහ සමාජවාදී ක්‍රියාමාර්ගයක් මත යුද්ධයට හා සමාජ අසමානතාවට එරෙහිව ස්වාධීන මහජන ව්‍යාපාරයක් ගොඩ නැගීමයි. ධනවාදයට ප්‍රගතිශීලී සහ සැබෑ විසඳුමක් අපේක්ෂා කරන සියලු දෙනාගෙන් අප ඉල්ලා සිටින්නේ ඉරාක යුද්ධයෙන් මතු කෙරෙන ප්‍රධාන දේශපාලනික සහ ඓතිහාසික ප්‍රශ්න සම්බන්ධයෙන් බිල් වෑන් සහෝදරයා ඔබ අමතන කොළඹ සහ මහනුවර රැස්වීම් වලට සහභාගි වන ලෙස යි.

**කොළඹ:**

**නව නගර ශාලාව, ග්‍රීන්පාත්, කොළඹ**

දිනය : **2004 ඔක්. 23**

වේලාව : ප.ව. 3.00

**මහනුවර:**

**කන්නන්ගර ශාලාව,**
**පේරාදෙනිය සරසවිය**

දිනය : **2004 ඔක්. 25**

වේලාව : ප.ව. 4.00

© www.wsws.org